# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2421/05 - 2025 ජනවාරි මස 27 වැනි සඳුදා - 2025.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 01/2025

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, රේගු ආඥාපනත (235 වැනි අධිකාරය වන) යටතේ 2023 මාර්තු මස 24 දිනැති අංක 2324/49 දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කර ඇති, රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ පවතින ඇමුණුම II හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) යටතේ වූ අයිතම අංක 33 මගින් දැක්වෙන, පහත සඳහන් නියමය 2025 ජනවාරි මස 28 වැනි දින සිට, ඉවත්කරනු ලබන බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

**රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ පවතින ඇමුණුම II හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) යටතේ වූ අයිතම අංක 33;**

"87 පරිච්ඡේදය යටතේ දැක්වෙන, 1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්ද අදාළ වන්නාවූ ආනයනය කරන ලද මෝටර් වාහන, එන්ජින් සවිකළ චැසි, බඳ (බොඩි) කැබිස් ඇතුළුව;"

අනුර කුමාර දිසානායක,<br>
මුදල්, ක්‍රමසම්පාදන සහ<br>
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ජනවාරි මස 27 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 01 - 0281


1A - PG 7008 - 429 (2025/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*